# සී/ස ලංකා නැව් සංස්ථාව
## (වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය)

# ඇබෑර්තු

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියකු වන සහ අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සහිත පුද්ගලයන්ගෙන් පහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1) කාර්මික අධිකාරී තනතුර - කොන්ත්‍රාත් පදනම (තනතුරු 01)

- **සුදුසුකම්** : ශ්‍රී ලංකාව, එක්සත් රජධානිය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, චීනය, ඉන්දියාව, පකිස්ථානය, නවසීලන්තය, මැලේසියාව, සිංගප්පූරුව, දකුණු අප්‍රිකාව හෝ අයර්ලන්තය හෝ අදාළ සහතිකය පිළිගැනීම සම්බන්ධව ශ්‍රී ලංකාව සමග ද්විපාර්ශ්වික ගිවිසුමකට එළඹ සිටින වෙනත් රටක නැව් පරිපාලන නියෝජිතායතනයකින් ප්‍රධාන ඉංජිනේරු ප්‍රවීණතා සහතිකය ලබා තිබීම

  හා

  කිලෝවොට් 3,000කට වැඩි ධාරිතාවකින් යුත් ප්‍රධාන එන්ජිමක් සහිත සමුද්‍රගාමී වෙළෙඳ නැවක ප්‍රධාන ඉංජිනේරු ලෙස අවම වශයෙන් වසර 02 ක පළපුරුද්ද

  හා

  නැව් අංගනයක හෝ නැව් සමාගමක අලුත්වැඩියා කළමනාකරණය සම්බන්ධව අවම වශයෙන් එක් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

- **වැටුප** : රු. 437,500/- ක මාසික දීමනාව

  මීට අමතරව, රජයෙන් අනුමත කළ මාසික වාහන දීමනාවක් සහ ඉන්ධන දීමනාව

- **වයස් සීමාව** : අවුරුදු 60

- **බඳවා ගැනීමේ ක්‍රමය** : පත්කිරීම් බලධරයා විසින් පත්කළ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම මගින්.

### රැකියා විස්තරය

- සමාගමේ ආරක්ෂක සහ තත්ත්ව අත්පොත් තුළ දක්වා ඇති ක්‍රියා පටිපාටීන් සහ කළමනාකාරිත්වය විසින් නිකුත් කළ උපදෙස් ක්‍රියාත්මක කිරීම
- නියම කළ යාත්‍රාවන් සඳහා වන ව්‍යවස්ථාපිත සහ පංති අවශ්‍යතාවයන් සමග අනුකූල වන බවට වග බලාගැනීම සහ අධීක්ෂණය කිරීම.
- තත්ත්ව අවශ්‍යතාවන් පූර්ණ ලෙස සැපිරීම පිණිස නාවික කළමනාකරණ කණ්ඩායම සමග එක්ව නියම කළ යාත්‍රාවන්ගේ කාර්ය සාධනය සහ තත්ත්වය කළමනාකරණය කිරීම.
- අර්ධ වාර්ෂික යාත්‍රා පරීක්ෂාවන් සිදු කිරීම සහ අවශ්‍ය විට පරීක්ෂණ වාර්තා අඩුලුහුඬුකම්, අභ්‍යන්තර වාර්තාවල සහ අදාළ දෙපාර්තමේන්තු වාර්තා අනුව නිවැරදි කිරීමට කටයුතු කිරීම.
- සැලසුම් කළ නඩත්තු පද්ධතිය හරහා යාත්‍රා වල සාමාන්‍ය නඩත්තුව අධීක්ෂණය කිරීම සහ වැඩ සහ වාර්තා යාවත්කාලීනව පවතින බව සහතික කිරීම.
- වැඩිදියුණු කිරීම් සහ වෙනස් කිරීම් සඳහා ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ යාත්‍රා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ සමාගම් ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සියලු අමතර කොටස්, අලුත්වැඩියා කිරීම් සහ සේවාවන් සඳහා කටයුතු සම්පාදනය කිරීම.
- වියලි-තටාක සැලසුම් කිරීම සහ එයට මැදිහත්වීම හා පවරා ඇති යාත්‍රා වල අලුත්වැඩියාවන් හා වෙනස් කිරීම් අධීක්ෂණය කිරීම.
- යාත්‍රා අළුත්වැඩියා / වෙනස් කිරීමේ කටයුතුවල නියැලී සිටින සියලුම තෙවන පාර්ශවයන් සෞඛ්‍ය, ආරක්ෂාව සහ පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සමාගම් ප්‍රතිපත්තියට අනුකූල වන බව සහතික කිරීම සඳහා නැව් මණ්ඩල කළමනාකරණ කණ්ඩායම සමග කටයුතු කිරීම.
- වගකීම් දෝෂයන් සමීපව නියාමනය කිරීම සහ අළුත්වැඩියා අවසන් කරන බවට සහතිකවීම.
- ධාවන වියදම් අයවැය සංවර්ධනය කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම.
- තත්ත්ව කළමනාකරණ පද්ධතියේ සංවර්ධනයට ක්‍රියාකාරීව සහභාගී වීම සහ දෙපාර්තමේන්තු ක්‍රියා පටිපාටි අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාවලියට සම්බන්ධ වීම.
- සිද්ධි විමර්ශන කණ්ඩායමේ පාර්ශවයක් ලෙස විමර්ශන සඳහා සහාය වීම

### අමතර ප්‍රතිලාභ

1. සේ.අ.අ. / සේ.නි.භා.අ.
2. බාහිර සහ අභ්‍යන්තර ප්‍රතිකාර සඳහා ශල්‍ය හා රෝහල්ගත රක්ෂණ ආවරණයක්
3. සම්පූර්ණ පුද්ගලික අනතුරු රක්ෂණ ආවරණයක්

### පොදු උපදෙස්

- සියළුම අයදුම්පත් තමා විසින් සත්‍ය බවට සහතික කරන ලද අධ්‍යාපන / වෘත්තීය සහතිකවල පිටපත් සමග උප්පැන්න සහතිකය, වෙනත් අදාළ සහතික වල පිටපත් සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහිතව ලියාපදිංචි තැපෑලෙන් සභාපති - සී/ස ලංකා නැව් සංස්ථාව හෝ **hr@cscl.lk** යන විද්‍යුත් ලිපිනයට **2021 පෙබරවාරි 23** දින හෝ ඊට ප්‍රථම යොමු කළ යුතුය.
- කරුණාකර අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කරන්න.
- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගෙන් අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.
- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධව සලකා බලනු නොලැබේ.
- පත්කිරීම් බලධරයා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් හරහා අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වෙනු ඇත. ඕනෑම ආකාරයක බලපෑමක් කිරීම නුසුදුසුකමක් වනු ඇත.


සභාපති

**සී/ස ලංකා නැව් සංස්ථාව**

අංක. 27, M.I.C.H. ගොඩනැගිල්ල,

ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය)

කොළඹ 1

**වැඩිදුර විස්තර සඳහා කරුණාකර අමතන්න 071 4452898**